## 420 සමන් කැකුළු තුවරලා

සමන් කැකුළු තුවරලා සුමුදු සුවඳ දී
හද පතුලෙනි මතුව නැගෙන බැතිය පුද දිදී
නමදිමු ලොව්තුරු අමා මවුනි පාතිමා
ඔබ තුරුලෙහි සෙවන අපට සුවය වේ සදා

පාතිමා මවේ
පාතිමා මවේ
හැඩය පැහැය ඔබ රුවේ
මා හදේ මැවේ

මෙලොව සතට බෙදුනු ඒ මිහිර සුර පෙමේ
නිබඳව පිළිබිඹුව පෙනේ සොඳුරු ඔබ මුවේ
කුළුණු බරය ඔබ ඉතා අපට පෑ මෙතා
මවුනි ඔබගෙ සරණ පිහිට පතති ලෝ සතා

පාතිමා හි කඳුකරේ පඳුරු තුරු සිරේ
පුදුම දසුන මගින් අපට පෑව ආදරේ
පෙම්බර සුර කුමරියේ නිමල මැණියේ
සිහි කරමින ඔබට යදිමු දින නිරන්තරේ